ප්‍රවෘත්ති අධ්‍යක්ෂ /ප්‍රවෘත්ති සංස්කාරක **2017 ජුනි 21**

# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2017 මැයි

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

**දුර: 011-2147414** **ෆැක්ස්: 011-2877945** **ඊමේල්: prices@statistics.gov.lk**

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිවේදනය කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා 2017 අප්‍රේල් මාසයේ උද්ධමනය 8.4% සිට 2017 මැයි මාසයේ වාර්ෂික උද්ධමනය 7.1%කට අඩුවී ඇති බව ප්‍රකාශ කලේය. 2017 මැයි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 4.6%ක හා ආහාර නොවන කාණ්ඩයේ 2.5%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2016 මැයි මාසයේ උද්ධමනය සඳහා මෙම එක් එක් කාණ්ඩයේ දායකත්වය 2.1%ක් හා 3.1%ක් විය.

කෙසේ නමුත් 2017 මැයි මාසයේ ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කළවිට 2017 අප්‍රේල් මාසයේ දර්ශකය 121.0 සිට 2017 මැයි මාසයේ දර්ශකය 121.8 දක්වා ඉහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කල විට 2017 මැයි මාසයේ මෙම වැඩිවීම 0.8ක දර්ශකාංක වැඩිවීමක් හා 0.7ක ප්‍රතිශතාංක වැඩිවීමක් ලෙස වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.43%කින් වැඩිවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.21%කින් වැඩිවීම බලපා ඇත.

ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා එළවළු, රතුළූණු, අළුත් මාළු, සහල්, පොල්, කරවල, සුදුළූණු සහ අර්තාපල් යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීම බලපා ඇත. එසේ වුවත් කෙසෙල්, පැපොල්, බිත්තර, සීනි, සහ අන්නාසි යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සසඳන කල 2017 මැසි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා ‘විවිධ භාණ්ඩ හා සේවා’, ‘ප්‍රවාහන’, ‘නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන’, ‘ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු’ සහ ‘රෙදිපිළි හා පාවහන්’ යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වැඩිවීම බලපා ඇත. ‘සෞඛ්‍ය’, ‘අධ්‍යාපන’ සහ ‘ආපනශාලා හා හෝටල්’ යන කාණ්ඩවල වියදම්වල වටිනාකම ඉතා සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. එසේ වුවත් ‘මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය’ කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවී ඇත. ‘සන්නිවේදන’ සහ ‘විනෝදාත්මක හා සංස්කෘතික’ සහ යන කාණ්ඩවල වියදම්වල වටිනාකම නොවෙනස්ව පැවතුණි.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | මිල දර්ශකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | වාර්ෂික උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2016** | මැයි | 113.7 | 1.9 | 5.3 |
| | ජුනි | 116.1 | 2.1 | 6.4 |
| | ජූලි | 115.2 | -0.8 | 5.8 |
| | අගෝස්තු | 113.3 | -1.6 | 4.5 |
| | සැප්තැම්බර් | 113.5 | 0.2 | 4.7 |
| | ඔක්තෝම්බර් | 114.7 | 1.1 | 5.0 |
| | නොවැම්බර් | 116.6 | 1.7 | 4.1 |
| | දෙසැම්බර් | 118.0 | 1.2 | 4.2 |
| **2017** | ජනවාරි | 119.3 | 1.1 | 6.5 |
| | පෙබරවාරි | 119.9 | 0.5 | 8.2 |
| | මාර්තු | 119.5 | -0.3 | 8.6 |
| | අප්‍රේල් | 121.0 | 1.3 | 8.4 |
| | මැයි | 121.8 | 0.7 | 7.1 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව